# ථේරවාද මාධ්‍යමික ශූන්‍යතා සංකල්පය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්; නාගාර්ජුනපාදයන්ගේ මූලමාධ්‍යමිකකාරිකාව සහ ථේරවාදී පාලි ත්‍රිපිටක සාහිත්‍යය ඇසුරින්

**ඕපනායක ධීරානන්ද හිමි**[1]

## හැඳින්වීම

ථේරවාද සහ මහායාන වශයෙන් බුදුසමයේ ප්‍රධාන ප්‍රශාඛා දෙකක් මූලික වශයෙන් හඳුනා ගත හැකි ය. එකී එක් එක් සම්ප්‍රදායන් තුළ ධර්මය සම්බන්ධයෙන් සිදු කර ඇති විග්‍රහයන් පිළිබඳ විමසා බැලීමේදී සමානතා මෙන් ම අසමානතා ද විද්‍යමාන වේ. මුල් බුදුසමයේ අභාසය ලදින් විකාශය වූ ථේරීය සම්ප්‍රදාය ථේරවාදී ත්‍රිපිටකයෙන් සහ තදනුබද්ධ සාහිත්‍යයෙන් සුපෝෂිත ය. මහායාන බුදුසමයේ කූථප්‍රාප්තිය ක්‍රි.ව.1 වන සියවස පමණ වන බව විචාරක මතය යි. බුදුරදුන් ධරමාන කාලයේ සිටම මහායාන බුදුසමයට අදාල පදනම සකස් වී තිබූ බව ඇතැමකුගේ මතය යි. එහෙත් මහායාන බුදුසමයේ උදාව සඳහා නිශ්චිත සාධනීය පදනම සකස් වූයේ දෙවන ධර්ම සගායනාවෙන් පසුව යි. එනම් බුදු සසුන නිකාය දහඅටකට බෙදී යාම නිසාවෙනි. එහි ලා මුල් බුදුසමයාගත ඉගැන්වීම් නව ආරයකට අර්ථකථන කිරීමෙහි නියුතු වූවෝ නව්‍ය චින්තකයෝ ලෙසින් ඉතිහාසයට එක් වූහ. ථේරවාදය තුළ පෙන්වා දුන් බුදු, පසේබුදු, මහරහත් යන යාන තුනට අමතර ව බෝධිසත්ත්ව යානය හඳුන්වාදීම මහායාන බුදුසමයේ මූලික ලක්‍ෂණයකි. එසේ ම බෞද්ධ චින්තන ධාරාව දාර්ශනික පදනමක් මත සාකච්ඡා කිරීම ද මහායානයේ ස්වභාවයකි. එහි ලා ථේරවාදී මූලික සංකල්ප ඉදිරිපත් කිරීමත් ගත් උත්සාහයක් ලෙසින් ශූන්‍යතාවාදය පෙන්වා දිය හැකි ය. ඒ මතු ද නොව බුද්ධ භක්තිය පිළිඹිබු කිරීම සඳහා ද මහායානය වැඩි ඉඩ හසරක් වෙන් කළ බව තත්‍රාගත ග්‍රන්ථාධ්‍යයනයෙන් ස්ඵුට වේ.

මහායානය දාර්ශනික නව්‍යතාවයන්ගෙන් සුපෝෂිත ය. එහි ලා නේක මහායාන ආචාර්යවරුන්ගේ ඉදිරිපත් කිරීම් හා ග්‍රන්ථකරණයන් පසෙකලිය නොහැකි ය. නාගාර්ජුන පාදයන් විසින් විරචිත මූලමධ්‍යමකකාරිකාව ප්‍රමුඛස්ථානයෙක්හිලා ගිණිය හැකි ය. තත් ග්‍රන්ථාන්තර්ගත ශූන්‍යතාවාදය සමස්ත මහායානිකයන්ගේ ඌන පූරණයක් ලෙසින් ද සැලකුව මනා ය. ප්‍රඥා පාරමිතාව පදනම් කරගත් ශූන්‍යාතා සිද්ධාන්තය ගැඹුරු දාර්ශනික ප්‍රවේශයන් ඔස්සේ මූලමාධ්‍යමික කාරිකාවෙහි ලා වර්ණිත ය. අනිර්වචනිය වූ නිර්වාණය පිළිබඳ සංකල්පීය අදහස් ජනිත කරවන සුළු වූ මූලමධ්‍යමකකාරිකාව මහායානිකයන් අතර පමණක් නොව හීනයානිකයන් අතර ද වඩාත් ජනප්‍රිය සිත්ගන්නා සුළු සකලාර්ථවහ ග්‍රන්ථයකි. ඒ අනුව එකී මූලමාධ්‍යමිකකාරිකාන්තර්ගත ශූන්‍යතාවයත් ථේරවාදී පාලි ත්‍රිපිටකය තුළ ඊට ලැබී ඇති ආස්ථානයත් මෙහි දී විමසුමට ලක් කෙරේ.

1. B.Ed /M.ED, (reading, University of Colombo), MA in Sanskrit (reading, Faculty of Graduate Studies, Buddhist and Pali University of Sri Lanka.), dheerananda99@gmail.com

**පර්යේෂණ ගැටලුව**

ආගමික අර්ථයෙන් මතු නොව ශූන්‍යතාවය පිළිබඳ දාර්ශනික විවරණයන් ථෙරවාදය තුළත් මහායානය තුළත් ගැඹුරින් සාකච්ඡාවට බඳුන් කර ඇත. ඒ අනුව එකී සම්ප්‍රදායද්වයෙහි ශූන්‍යතා සංකල්පය පිළිබඳ ව ඉදිරිපත් කර ඇති දාර්ශනික විවරණයන් තුළින් ඉදිරිපත් කෙරෙන සමවිෂමතා සහ ප්‍රවණතාවන් පවතී ද යන්න විමසා බැලීම මෙහි පර්යේෂණ ගැටලුව යි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙහි දී පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය භාවිත කරයි. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර අධ්‍යයනය කිරීමෙන් දත්ත රැස් කරන අතර පාඨ හා සංධාරක විශ්ලේෂණ ක්‍රමය ඔස්සේ කරුණු අනාවරණය කිරීමට අපේක්ෂිත ය.

**සාකච්ඡාව**

උක්ත සන්දර්භයට අදාල සාහිත්‍ය පිළිබඳ විමසා බැලීමේ දී මහායාන ශූන්‍යතා සංකල්පය පිළිබඳ සිදු කළ පර්යේෂණ අනාවරණය කර ගත හැකි ය. නමුත් එකී සම්ප්‍රදායද්වයේ ශූන්‍යතා සංකල්පයට ලැබී ඇති ආස්ථානය පිළිබඳ සිදු කර ඇති විමර්ශනයන්ගේ යම් කෘෂ භාවයක් විද්‍යමාන වේ. එහෙයින් ඒ පිළිබඳ ව තුලනාත්මකව විමසා බැලීම දාර්ශනික වශයෙන් වැදගත් වන බව පෙනේ.

- මුල් බුදුසමයාගත ශූන්‍යතා දර්ශනය

ශූන්‍යතා දර්ශනය යනු මහායාන ධර්මයට අයත් ලංකාවතාර සූත්‍රයේ ඉගැන්වෙන දර්ශනයඃ ශාස්වත උච්ඡේදවාද දෙකට අයත් අස්ති නාස්ති දෙකට නොගොස් මධ්‍යම ප්‍රතිපදාව පිළිගැනීමේ දර්ශනය මෙන් ම මාධ්‍යමික සම්ප්‍රදායේ ප්‍රධාන සිද්ධාන්ත දර්ශනය යි. ශූන්‍ය යන්නෙන් හිස් බව හෙවත් පාලු බව ගම්‍යමාන වන බව සංස්කෘත ශබ්දාර්ණවය දක්වයි. කෙසේ නමුත් 'ශූන්‍ය' යන්නෙහි වාච්‍යාර්ථය එසේ වුව ද දාර්ශනික සංකල්පයක් වශයෙන් විග්‍රහ කර බැලීමේදී එහි ලා ගාම්භීරාර්ථයක් සූචනය වේ. නාගාර්ජුනපාදයන් ඉදිරිපත් කළ මාධ්‍යමක දර්ශනයේ පදනම වූයේ ශූන්‍යතාවය යි.

ශූන්‍යතාව යන වචනය මුල් බුදුසමය තුළ දී 'සුඤ්ඤ' යනුවෙන් භාවිත වූ බව සූත්‍රාගත සාධක හෙළි කරයි. එක් අවස්ථාවක ආනන්ද හිමියන් විසින් බුදුන් වහන්සේගෙන් මෙසේ ප්‍රශ්න කරනු ලැබී ය.

'සුඤ්ඤො ලොකො සුඤ්ඤො ලොකොති භන්තෙ වුච්චති. කිත්තාවතානු ඛො භන්තෙ සුඤ්ඤො ලොකොති වුච්චති.'

(ස්වාමීනි ලෝකය ශූන්‍ය යි. ලෝකය ශූන්‍ය යි කිය යි. කොපමණකින් ලෝකය ශූන්‍ය වේ ද?)

මීට පිළිතුරු වශයෙන් බුදුන් වහන්සේ මෙසේ දේශනා කළ හ.

''යස්මාචානන්ද සුඤ්ඤං අත්තෙන වා අත්තනීයෙන වා තස්මා සුඤ්ඤො ලෝකො ති වුච්චති''

(ආනන්ද යම් හෙයකින් ආත්මය හෝ ආත්මය සම්බන්ධ වූවක් නැත්තේ ද එහෙයින් ලෝකය ශූන්‍ය වේ)

එසේ ම බුදුන් වහන්සේ ශූන්‍යතා විහරණයෙන් වාසය කළ බවත් එහි ඇති සුශ්‍රැත භාවයත් සුග්‍රහීත භාවයත් පිළිබඳ සූත්‍රාගත සාධක දැක් වේ. මජ්ඣිම නිකායේ එන චූලසුඤ්ඤත සූත්‍රයේ දී බුදුන් වහන්සේ ආනන්ද හිමියන්ට ප්‍රකාශ කර සිටින්නේ තමන් වහන්සේ ශූන්‍යතාවිහාරය බහුල කොට වාසය කරන බව යි. මෙහිලා ශූන්‍යතාවය ලෙසින් බුදුසමය අවධාරණය කරනු ලබන්නේ භෞතිකමය හිස් භාවයක් නොවන බව චූලසුඤ්ඤත සූත්‍රය දීර්ඝ වශයෙන් විස්තර කරයි. එහි දී ආනන්ද හිමියන්ට බුදුන් වහන්සේ ප්‍රකාශ කරන්නේ තමන් වහන්සේ දැනුදු ශූන්‍යතා විහරණයෙන් බහුල කොට වාසය කරන බව යි. එසේ ම මේ ප්‍රදේශය ඇත් ගව අස් වෙළඹුන් ගෙන් ශූන්‍ය වේ ද, රන්රිදියෙන් ශූන්‍ය වේ ද,ස්ත්‍රී පුරුෂ සන්නිපාතයෙන් ශූන්‍ය වේ ද එතකුදු වුවත් අශූන්‍යභාවයක් ඇති බව දක්වයි.

■ නාගාර්ජුනපාදයන් ඉදිරිපත් කළ ශූන්‍යතා දර්ශනය

මහායාන දර්ශනයෙහි ප්‍රධාන සම්ප්‍රදායක් වන මාධ්‍යමික දර්ශනය නියෝජනය කරන්නා වූ නාගාර්ජුනපාදයන් විසින් රචිත විශිෂ්ටතම ග්‍රන්ථය මූලමධ්‍යමකකාරිකාව යි. වර්තමාන බෞද්ධ දාර්ශනික සන්දර්භය තුළ වෙසෙසා විචාරයට බඳුන් වන ග්‍රන්ථය ලෙසින් ද මෙම මූලමධ්‍යමක කාරිකාව හැඳින්විය හැකි ය. මහායානය තුළ ශූන්‍යතා සංකල්පය පිළිබඳ ව අවධාරණය කර ඇති ප්‍රාමාණික මූලාශ්‍රය ලෙසින් නාගාර්ජුනපාදයන්ගේ මූලමධ්‍යමකකාරිකාව පෙන්වා දිය හැකි ය. බෞද්ධ දර්ශනාගත සමස්ත හර පද්ධතීන් හකුලුවා දැක් වූ කෘතියක් ලෙසින් ද මෙය අගය කළ හැකි ය.

බුදුසමයාගත පටිච්චසමුප්පාදය අනුවම ස්වකීය ශූන්‍යතාවාදය දක්වන නාගර්ජුනපාදයෝ සයංකත වාද පරංකත වාද ආදිය බැහැර කරති. එහෙත් ශූන්‍යතාවය ද දෘෂ්ටියක් ලෙසින් නොගත යුතු බව නාගර්ජුනපාදයෝ අවධාරණය කරති. එනම් ශූන්‍යතාවය වනාහී සියලු දෘෂ්ටීන්ගෙන් මිදීම යැයි මුනිවරුන් විසින් ප්‍රකාශ කොට ඇති බවත් යමකු හට ශූන්‍යතාවය දෘෂ්ටියක් වේ නම් ඔවුන් සුවකළ නොහැකි බව දක්වයි. ඒ අනුව සියලු දෘෂ්ටි ප්‍රහාණය කිරීම ශූන්‍යතාවය වුවත් ශූන්‍යතාවය වශයෙන් ගත හැකි ඉතිරිවන තවත් දෘෂ්ටියක් නොවන බව අවධාරණය කරයි.

**නිගමනය**

පටිච්චසමුප්පාදය නිරවශේෂ වශයෙන් අවබෝධ කර ගැනීම නිර්වාණය ම බව මුල් බුදු සමය පෙන්වා දෙයි. තවත් අයුරකින් කිවහොත් මධ්‍යම ප්‍රතිපදාවේ පාරප්‍රාප්තිය නිවන යි. ඒ අනුව මධ්‍යප්‍රතිපදාව හා පටිච්චසමුප්පාදය යනු දෙකක් නොව එකීභූත තත්වයකි. මෙකී පටිච්චසමුප්පාද සිද්ධාන්තය මුඛ්‍ය උපකරණය කර ගනිමින් නාගාර්ජුනපාදයන් මාධ්‍යමික දර්ශනය ඉදිරිපත් කර ඇත. එහි ලා ශූන්‍යතාවය යනුවෙන් අදහස් කරනුයේ මුල් බුදුසමයාගත අනාත්ම වූ ස්වභාවයම බව පැහැදිලි ය. එකී ශූන්‍යතාවය මත පදනම් ව නාගාර්ජුනපාදයන් නිර්වාණය පිළිබඳ වැදගත් දාර්ශනික ප්‍රවේශයන් රැසක් මූලමාධ්‍යමිකකාරිකාවෙහිලා අභිප්‍රේරිත ය. සමස්තයක් වශයෙන් උක්ත කරුණු පිළිබඳ විමසා බැලීමේදී නාගාර්ජුනයන්ගේ මාධ්‍යමික දර්ශනාගත මූලමාධ්‍යමිකකාරිකාව

හා තදීය ඉගැන්වීම් සමුදාය මුල් බුදුසමයාගත ගැඹුරු හර පද්ධතීන් ඔප මට්ටම් කළ පශ්චාත් ත්‍රිපිටක ප්‍රාමාණික මූලාශ්‍රයක් ලෙසින් අගය කිරීම අතිශයින්ම යුක්තියුක්ත ය.

**මුඛ්‍ය පදඃ** ත්‍රිලක්ෂණ, ථේරවාද, මහායාන, ශූන්‍යතාව,  සුඤ්ඤතාව

## ආශ්‍රිත ග්‍රන්ථ

*මජ්ඣිම නිකාය.* (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා 12. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*සංයුත්ත නිකාය 4.* (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිකට ග්‍රන්ථ මාලා 16. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

තිලකරත්න, අසංග. (2001). *ශූන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය.* නුගේගොඩඃ තිවිර ප්‍රකාශන.

ධම්මජෝති හිමි, මැදවච්චියේ. (2022). *ඉන්දියානු මහායාන බුදුසමය.* නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ.

සාසනරතන හිමි, මොරටුවේ.  (2012). *ලක්දිව මහායාන අදහස්.* බොරලැස්ගමුවඃ විසිදුනු ප්‍රකාශන.

සුමනසාර හිමි, ඇත්කඳුරේ සහ විජේසිංහ, එස්.ඒ.ජී. (2014). *මහායාන මතවාද විමර්ශන.* කොළඹ 10ඃ සමයවර්ධන.

*සරසවි සිංහල-සිංහල ශබ්ද කෝෂය.* (2013). නුගේගොඩඃ සරසවි ප්‍රකාශන.